# ඉස්ලාමයේ ලිංගික වහල් සේවය

කුරානයේ 23: 6 වැකියේ මෙසේ සඳහන් වෙයි.

> එහෙත් ඔවුන් තමන්ගේ භාර්යාවන් වෙත හෝ නැතහොත් තමන්ගේ දකුණු අත් හිමිකර ගත් (වහල්) ස්ත්‍රීන් වෙත හෝ (එක්කාසු වීමෙන්) නියත වශයෙන්ම (ඔවුන් වැරදිකරුවන් නොවන්නාහ. එබැවින් මෙම කාරණාවෙහි) ඔවුන් නින්දා කරනු නොලබන්නාහ. මෙයට පටහැනි දැයක් කවුරුන් හෝ කැමති වුවහොත් ඔවුන් සීමාව ඉක්මවූ අය බවටද, (වැරදිකරුවන් බවටද) පත් වන්නාහ.

සයියද් අබුල් අලා මවුදූදි යනු මෑත යුගයේ සිටින ඉහළ පිළිගැනීමක් ඇති කුරාන අර්ථවිචාරකයෙකි. ඉස්ලාමීය විද්වතෙකි. ඔහු සිය කුරාන අර්ථවිවරණයේ (තෆ්සීර්) මෙම වැකිය අර්ථ නිරූපණය කරන්නේ පහත පරිදි ය.

> ලිංගික ව එක්වීම අපරාධයක් නොවන කාන්තාවන් දෙකොටසක් දක්වා ඇත. එනම් භාර්යාවන් සහ තමාට නීත්‍යානුකූලව හිමි වූ අය (වහල් ස්ත්‍රීන්) යන අයයි. මේ අනුව බිරිඳ සමග මෙන් ම සිය වහල් ස්ත්‍රීන් සමග ද ලිංගිකව හැසිරීමේ අවසරය මෙම වැකිය ඉතා පැහැදිලිව ලබා දී ඇත. වහල් ස්ත්‍රීන් සමග ලිංගික හැසිරීමට ඔවුන් සමග විවාහ වී සිටීම අවශ්‍ය නොවන අතර හිමිකාරීත්වය තිබීම ම සෑහේ. [1]

ඔහු පවසන්නේ වහල් ස්ත්‍රීන් සමග ලිංගිකව එක්වීමට ඔවුන් සමග විවාහ වීම අවශ්‍යතාවයක් විණි නම් වහල් ස්ත්‍රීන් වෙනම පිරිසක් වසයෙන් දැක්වීමේ වුවමනාවක් නැති බවයි. භාර්යාවන් යන්නට විවාහ කරගත් වහල් ස්ත්‍රීන් ද අයත් වන බැවිනි. ඔවුන් වෙන ම සඳහන් කිරීමෙන් ඔවුන් සමග ලිංගික ව එක්වීමට විවාහය අවශ්‍යතාවක් නොවූ බව පැහැදිලි වන්නේ යැයි හෙතෙම පවසයි. මෙහි වහල් ස්ත්‍රීහු යනු කවරහු ද?

ඉස්ලාමයට පෙර පටන් අරාබියේ වහල් සේවය පැවති අතර එය ඉස්ලාමය විසින් ද තහනම් නොකෙරුණි. ඒ වෙනුවට ඔවුන් එය නියාමනය කරන ලදී. ඉස්ලාමය විසින් වහල් සේවය අහෝසි කළ බවට කිසිදු කුරාන වැකියක හෝ හදීසයක සඳහන් නොවෙතත් ඇතැම් නූතනවාදී විද්වතුන් සහ බැතිමතුන් විසින් වහලුන් නිදහස් කිරීම දිරිමත් කරන කුරාන වැකි දක්වමින් පවසන්නේ වහල් සේවය එකල දැඩි ව සමාජ සම්මත දෙයක් වූ බැවින් එය ක්‍රමික ව අහෝසි කිරීමේ මාවත ඉස්ලාමය විසින් තෝරාගත් බවයි. කෙසේවෙතත් ඉස්ලාමය තුළ ඊට පෙර සිට අත්කරගත් වහල් පරම්පරාවලින් පැවත එන වහලුන් කැමතිනම් නිදහස් කිරීමටත් කැමතිනම් වහල්භාවයේ රඳවා ගැනීමටත් අවසර තිබුණි. ඒ අනුව මේ කියන ලිංගික ව හැසිරීමට අවසර තිබෙන තමා යටතේ සිටින වහල් ස්ත්‍රීන්ගෙන් පිරිසක් එවැනි පරම්පරාගත වහලියන් ය. පරපුරින් හැරුණු විට වහලුන් සැපයුණු අනෙක් ක්‍රමය වූයේ යුද්ධයේ දී ජීවග්‍රහයෙන් ගත් පිරිස් හෙවත් යුධසිරකරුවන් වහලුන් බවට පත්කර ගැනීමයි. මෙහි දී වහලුන් බවට පත්වන කාන්තාවන් ද වහල් කාන්තාවන් බැවින් ඉහත වැකිය අනුව භාර්යාවන්ට අමතරව ඔවුන් සමග ද ලිංගිකව එක්විය හැක.

මෙහි දී මෙම ස්ත්‍රීන් සමග ලිංගික ව හැසිරීමට දී තිබෙන අවසරය ඔවුන් ව දූෂණය කිරීමටත් ඉඩ හරින්නේ ද යන්න එතරම් පැහැදිලි නැත. ඒ නිසා අප එය සොයා බලා නිශ්චය කරගත යුතු ය. ඇගේ කැමැත්තෙන් තොර ව කාන්තාවක් සමග ලිංගික ව එක්වීම දූෂණයයි. එක්කෝ ඉස්ලාම් නීතිය තුළ මෙවැනි යුධසිරකාරියන් සමග ලිංගික ව එක්වීමට පෙර ඔවුන්ගේ කැමැත්ත තිබිය යුතු බව පෙන්වන නියමයක් හෝ එවැනි නීතියක් බිහිවීමට තුඩුදෙන කුරාන වැකියක්, හදීසයක් තිබිය යුතු ය. එසේ නැතිනම් ස්ත්‍රීදූෂණයක් සංයුක්ත වන කරුණු යටතට වහල් ස්ත්‍රියක් සමග ඇගේ කැමැත්තෙන් තොර ව එක්වීමත් ඇතුළත් කර තිබිය යුතු ය. මේ දෙකින් එකක් හෝ ඇත්නම් ඉස්ලාමය තුළ ස්ත්‍රීදූෂණයකට ඉඩක් නැත. නමුත් මේ කිසිවක් නොමැති නම් ඉස්ලාමය මෙම ස්ත්‍රීන් දූෂණයට ඉඩ දී ඇති බව සිතීම සාධාරණ ය.

---

1 https://www.englishtafsir.com/Quran/4/index.html

මේ විමසීමේ දී වැදගත් කරුණකට අපි දැන් යොමුවෙමු. ඒ කුරානයේ 4: 24 වන වැකිය යි. එහි තහනම් වන ස්ත්‍රීන්, තහනම් ඥාති සබඳතා ආදිය සඳහන් කරමින් මෙසේ ද පවසයි.

> සැමියන් සිටින කාන්තාවන්වද (ඔබට විවාහ කර ගැනීම තහනම්) කර ඇත්තේය. එහෙත් ප්‍රතික්ෂේප කරන්නන් සමග සිදු වූ යුද්ධයෙන් අත් අඩංගුවට ගනු ලැබ) ඔබගේ යටතෙහි සිටින (වහල්) ස්ත්‍රීන් හැර

මෙහි සරල අර්ථය කුමක් ද? යුධසිරකාරියන් සමග හිමිකරුවන්ට ලිංගික ව එක්වීමට ඔවුන් විවාහක අය වීම බාධාවක් නැති බවයි. මේ වැකිය පහළ වූ අවස්ථාව පිළිබඳ විමසා බැලීම ද මෙහි අර්ථය තේරුම් ගැනීම සඳහා වැදගත් වනු ඇත. මෙය පහළ වූ අවස්ථාව අබුදාවුද්හි 2150 හි මෙසේ සඳහන් වේ.

> අබු සායිද් අල් කුද්රි මෙසේ දැනුම් දෙයි. හුනායින් යුද්ධයේ දී නබිතුමන් විසින් අව්තාස් වෙත බලඇණියක් යවන ලදී. සිය සතුරු හමුදාවට මුහුණ දී ජයග්‍රහණය කළ ඔවුන් සටනින් ඉතිරි ව සිටි අය ජීවග්‍රහයෙන් ගත්හ. ඔවුන් අතර සිටි කාන්තාවන් සමග ඔවුන්ගේ අන්‍යාගමික ස්වාමිපුරුෂයන් ද සිටි බැවින් ඇතැම් සහාබාවරු එම කාන්තාවන් සමග ලිංගිකව එක් නොවී සිටියහ. එබැවින් ප්‍රඥාවන්ත වූ අල්ලාහ් විසින් ඉද්දාව (මාස් ශුද්ධා තුනක කාලය) සම්පූර්ණ කළ පසු එවැනි ස්ත්‍රීන් ද තහනම් නොවන බව පෙන්වාදෙනු පිණිස මෙම වැකිය පහළ කරන ලදී. එනම් සැමියන් සිටින කාන්තාවන්වද *(ඔබට විවාහ කර ගැනීම)* තහනම් කර ඇත්තේය. එහෙත් ප්‍රතික්ෂේප කරන්නන් සමග සිදු වූ යුද්ධයෙන් අත් අඩංගුවට ගනු ලැබ ඔබගේ යටතෙහි සිටින *(වහල්)* ස්ත්‍රීන් හැර.[2]

මෙහි අල්ලාහ් විසින් මෙම දිරිමත් කිරීම කරන පසුබිම සැලකිල්ලට ගැනීම ඉතා වැදගත් ය. එනම් මුස්ලිම්වරු පිරිසක්, සැමියන් සිටින කාන්තාවන් සමග, සැමියන් ද ඒ පිරිස අතර සිටිය දී ලිංගික ව හැසිරීම නුසුදුසු යැයි සිතා ඉන් වැළකී සිටින විටයි. එසේ වැළකීමෙන් වැළැක්වීම, එනම් කාන්තාවන් සිය සැමියන් ද ඉදිද්දී ඔවුන් ව අල්ලාගත් මුස්ලිම්වරු සමග ලිංගික එක්වෙනු දැකීම දෙවියන්වහන්සේගේ අභිප්‍රායයි. මෙම කාන්තාවන් පසුව හමුවන ළඟ ම වහල් වෙළඳපොලේ දී මුස්ලිම්වරුන්ට අවිආයුධ මිලදී ගැනීමට මුදල් ලබාගැනීම වෙනුවෙන් විකිණීමට නියමිත ව සිටි අයයි. එමෙන් ම ඔවුන් මෙසේ සැමියන් ද සිටියදී ලිංගික ව හැසිරුණු බව පැවසෙන්නේ තමන්ගේ ඥාතීන්, සැමියන් මරාදමා තමන්ව අත්අඩංගුවට ගත් සතුරු හමුදාවක් සමගයි. මෙවැනි පසුබිමක සිටින කාන්තාවක් තමන් සමග ලිංගික ව හැසිරීමට තම ගෝත්‍රයේ අය ඝාතනය කරමින් තමා සිරභාරයට ගත් සතුරන් පිරිසකට කැමැත්තෙන් ඉඩ දෙනු ඇතැ යි සිතිය නොහැක. සැබවින් ම මෙහි (හෝ වහල් ස්ත්‍රීන් සමග ලිංගික ව හැසිරීම ගැන සඳහන් වන කිසිදු හදීසයක) ඔවුන්ගේ කැමැත්තක් ගැන සඳහන් නොවේ.

මේ ඇසුරු කෙරෙන තවත් හදීස කීපයක් සලකා බැලීම යුතු යැයි සිතමි. සහීහ් බුහාරි 4350 හි මෙලෙස සඳහන් වේ.

> බුරයිදා මෙසේ දැනුම් දෙයි. නබිතුමන් අලි ව (යුද්ධයෙන් ලැබුණු) කුමුවරුන් ව රැගෙන ඒම පිණිස බාලිඩ් වෙත යැවී ය. මට අලි ගැන අප්‍රසන්න හැඟීමක් ඇති විය. ඒ ඔහු (කුමුවරුන් අතර සිටි වහල් කෙල්ලක් සමග ලිංගික ව එක්වීමෙන් අනතුරු ව) ස්නානය කරනු දුටු හෙයිනි. ඔබ එය (අලි කළ දෙය) දුටුවා නේදැ යි මම බාලිඩ්ගෙන් ඇසීමි. නබිතුමන් වෙත ගියවිට මම මේ ගැන ඔහුට පැවසුවෙමි. ඔබ අලි කළේ වරදක් යැයි සිතනවාදැයි හෙතෙම මගෙන් විමසීය. මම එය එසේ බව පැවසුවෙමි. බුරයිදා, ඔහුට මීට වඩා තව බොහෝ දේ කුමුවරුන්ගෙන් ලැබිය යුතු ව තිබෙද්දීත් ඔබ අලි ව මේ ගැන පිළිකුල් කරනවා දැයි හෙතෙම මගෙන් නැවත වරක් ඇසී ය. [3]

අබුදාවුද් 29.29.32.100 වහල් කාන්තාවන් සමග ලිංගික ව එක්වීමේ දී ඔවුන්ගේ කැමැත්තක් තිබිය යුතු ද යන්න නිර්ණය කිරීමේ දී ඉතා වැදගත් හදීසයකි.

2 https://sunnah.com/abudawud/12/110
3 https://sunnah.com/bukhari/64/377

හුමයිද් ඉබ්න් ක්වායිස් අල් මක්කි, මාලික්ගෙන් දැනගත් දෙයක් යහ්යා මට පැවසීය. එනම් දාෆිෆ් නම් කෙනෙක් කියූ පරිදි වහල් කාන්තාවන් සමග ලිංගිකව එක්වීමේ දී ශුක්‍ර විදීමට පෙර ලිඟුව පිටතට ගැනීම පිළිබඳව ඉබ්න් අබ්බාස්ගෙන් විමසා ඇත. ඔහු තම වහල් කෙල්ලකට අඬ ගසා ඔවුන්ට ඒ ගැන කියන්නැයි කීය. ඇය ලැජ්ජාවෙන් සිටියා ය. *එය කිරීමේ කිසිම වරදක් නැහැ. මා පවා එසේ කරනවා* යැයි මාලික් පැවසුවේ ය. *කිසිම මිනිසෙක් ඇගේ කැමැත්තෙන් තොර ව නිදහස් ස්ත්‍රියක් සමග එසේ නොකළ යුතු ය. වහල් ස්ත්‍රියක් සමග ඇගේ කැමැත්තෙන් තොර ව එසේ කිරීමේ කිසිම හානියක්/වරදක් නොමැත. එසේ ම අන් කිසිවකුගේ වහල් ස්ත්‍රියක් බිරියක් ලෙස සිටින අයෙක් ද ඇගේ හිමිකරුවන්ගේ කැමැත්තෙන් තොර  ව එසේ ලිඟුව පිටතට ගැනීම නොකළ යුතු ය.* (යැයි මාලික් කීය.)[4]

ඉස්ලාම් නීතියට අනුව වහල් ස්ත්‍රියක් සහ නිදහස් ස්ත්‍රියක් කෙරෙහි බලපාන නීති තත්ත්වයන් දැඩි ව වෙනස් වන බව මෙයින් පෙනේ. ඉස්ලාම් නීතිය අනුව සිය බිරිඳ සමග සංසර්ගයේ දී ඇගේ කැමැත්තෙන් තොර ව ශුක්‍ර විදීමට පෙර ලිඟුව පිටතට ගැනීම හෝ වෙනත් ක්‍රමයකින් උපත් පාලනය කිරීම තහනම් ය. එය මෙහි පමණක් නොව ඉස්ලාම් වියතුන් විසින් ලියූ කෘති සහ නිකුත් කළ නියෝග කීපයක ද දැක්වෙයි. නමුත් මෙම හදීසයෙන් ඉතා පැහැදිලිව පෙන්වා සිටින පරිදි වහල් කාන්තාවක් නම් අස්ල් කිරීම සඳහා ඇගේ කැමැත්ත අවශ්‍ය නැත. එමෙන් ම ඇය තමාගේ වහල් ස්ත්‍රියක් නොවේ නම් ඇගේ හිමිකරුගේ අවසරයෙන් තොර ව එසේ නොකළ යුතු ය. වෙනත් ලෙසකින් කියනවා ඇය සමග සිදුවන සංසර්ගයේ දී දරුවකු බිහිවිය යුතු ද යන්න තීරණය කිරේම් අයිතිය ඉස්ලාම් නීතිය ඇයට ලබා නොදෙන අතර ඒ අයිතිය ඇගේ හිමිකරුට ලබා දෙයි. නමුත් විවාහක කාන්තාවට තමන් සමග සංසර්ගයෙන් දරුවක් ඉපදිය යුතු ද යන්න තීරණය කිරීමේ අයිතිය තිබේ. මෙහි දී අයිතිය ඇය සතු විය යුතු කරුණක් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ අයිතිය ඇගේ හිමිකරුට පවරා තිබේ. ඒ සාමාන්‍ය ස්ත්‍රියකගේ අයිතීන් ඇය භුක්ති නොවිදින බව නෛතික ව පෙන්වා දෙමිනි. තීරණ ගැනීමේ අයිතිය ඇය සතු විය යුතු අනෙක් ලිංගික කරුණු සම්බන්ධයෙන් ද අයිතිය හිමිකරුවා ම සතුවන බව සිතීම තර්කානුකූල ය.

ඉස්ලාම් නීතිය අනුව විවාහක කාන්තාවක් සමග ලිංගිකව එක්වීමට ඇගේ කැමැත්ත අවශ්‍ය නොවන බව ද සිහිපත් කළ යුතු ය. ඉස්ලාම් නීතියේ වෛවාහක ස්ත්‍රීදූෂණයක් නොමැත. කුරානයේ 2: 222 වැකිය පහත පරිදි ය.

ඔබගේ භාර්යාවන් ඔබට අයත් කෙතකි.  එබැවින් ඔබගේ කෙතට ඔබ කැමති අන්දමට ගොස්, කැමති පැත්තකින් කැමති ආකාරයෙන් ඇතුලු වනු.

එමෙන් ම බුහාරි 3237 හදීසය මෙබඳු ය.[5]

අබූ හුරයිරා විසින් පවසන ලදී.

සැමියකු සිය බිරියට තමන් සමග ලිංගික ව එක්වීමට ඇරයුම් කළ විටක ඇය එය ප්‍රතික්ෂේප කර ඔහු ට කේන්තියෙන් නිදන්නට සැලැස්සුවහොත් එදින පහන් වන තුරු දේවදූතයන් ඇයට සාපකරන්නේ ය යනුවෙන් අල්ලාහ්ගේ දූතයා පැවසීය.

විවාහක කාන්තාව සමග එක්වීමේදීවත් ඇගේ කැමැත්ත අවශ්‍ය නොවිණි නම්, ඇතැම් ලිංගික කරුණු සම්බන්ධයෙන් විවාහක කාන්තාවට තිබෙන අයිතිය නොමැති බව පෙනීගිය වහල් කාන්තාව සමග එක්වීමට ඇගේ කැමැත්ත තිබිය යුතු යැයි පැවසිය හැකි ද?

කුරානයේ 24: 33 වැකිය මෙ පරිදි ය.

තම පතිවත රකිමින් සිටින ඔබගේ වහල් ස්ත්‍රීන් මෙලොව ජීවිතයට අයත් එක් අල්ප වස්තුව ඔබට ලබා ගැනීම පිණිස ගණිකා වෘත්තියේ යෙදෙන ලෙස බල නොකරනු. ඔවුන් ව කවුරුන් හෝ බලකිරීමට ලක් කළහොත් නියත වශයෙන් ම බල කිරීමට ලක් වූ ඔවුන්ට අල්ලාහ් ඉතාමත් සමාව දෙන්නෙකු හා කරුණාවන්තවද සිටින්නේය.

4 https://sunnah.com/urn/412860

5 https://sunnah.com/bukhari/59/48

මෙම වැකිය වහල් ස්ත්‍රීන්ට ලිංගික හැසිරීම්වලට බල නොකරන ලෙස පවසන්නක් යැයි මතුපිටින් පෙනී ගිය ද භාෂාව හා සන්දර්භය අනුව එය එසේ නොවේ. මෙහි පවසන්නේ මුදල් ලබා ගැනීම උදෙසා තම වහල් කාන්තාවන්ට ගණිකා වෘත්තියේ යෙදෙන ලෙස බල නොකරන ලෙස ය. තමන් සමග ලිංගික ව එක්වීමට ඔවුන්ට බල නොකරන ලෙස නොවේ. මෙය පහළ වූ අවස්ථාව විමසන විට මෙය තවත් පැහැදිලි වේ.

මේ වැකිය පහළ වූ අවස්ථාව සහීහ් මුස්ලිම් 43:7180, සහීහ් මුස්ලිම් 43:7181, සුනන් අබූ දාවූද් 12,2302 හි මෙසේ සඳහන් වේ.

> ජබීර් පැවසූ පරිදි බින් උබයී බින් සාලුල් සිය වහල් කෙල්ලට පල, *(වේසකමේ) ගොසින් අපට යමක් උපයාගෙන එව යි* කීමට පුරුදුව සිටියේ ය. ඒ අවස්ථාවේ දී අල්ලාහ් තම පතිවත රකිමින් සිටින ඔබගේ වහල් ස්ත්‍රීන් මෙලොව ජීවිතයට අයත් එක් අල්ප වස්තුව ඔබට ලබා ගැනීම පිණිස ගණිකා වෘත්තියේ යෙදෙන ලෙස බල නොකරනු. ඔවුන් ව කවුරුන් හෝ බලකිරීමට ලක් කළහොත් නියත වශයෙන් ම බල කිරීමට ලක් වූ ඔවුන්ට අල්ලාහ් ඉතාමත් සමාව දෙන්නෙකු හා කරුණාවන්තවද සිටින්නේය යන වැකිය පහළ කළේ ය.

යුද්ධයෙන් අල්ලාගත් එක්තරා දැරියක් සමග ලිංගික ව එක්වීම විෂයෙහි මුහම්මද් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමන් ක්‍රියා කළ ආකාරය දැක්වෙන එක්තරා හදීසයක් ද තිබේ. එම හදීසයේ ඉංග්‍රීසි පරිවර්තනය වංචනික ලෙස කර ඇති බැවින් මුල් හදීසය (Bukhari Volume 7: 63: 182:) වෙනුවට ඒ පිළිබඳ ව හිටපු මුස්ලිම්වරයකු ලියූ කෘතියකින් උපුටා දක්වමු.

> එක්තරා හදීසයකට අනුව ඔහු බානි ජවුන් නගරය අත්පත් කරගත් පසු ජවුනිය්යාහ් නමැති දැරියක් ඇගේ කිරිමවත් සමග ඔහු වෙත රැගෙන එනු ලැබුවා ය. ඔබ මා සමග එක්වන්න ඕනෑ (give yourself to me) නබිතුමන් ඇයට පැවසුවේ ය. නූතන ව්‍යවහාරයෙන් - මට උඹ එක්ක නිදාගන්න ඕන. කුමරියක් එහෙම නිකම් මිනිහෙකුට තමන් ව දෙනවා ද ? දැරිය පිළිතුරු ලෙස කියා සිටියා ය. මුහම්මද් එවිට ඇයට පහරදෙනු පිණිස සිය අත එසවී ය. මම ඔබෙන් අල්ලාහ්ගේ රැකවරණය අපේක්ෂා කරනවා යැයි දැරිය එවිට බියෙන් කෑ ගැසුවා ය.
>
> මෙය ඇසුණු මුහම්මද් අදහස් කළ දෙය කිරීමෙන් වැළකුණි. ඒ මොහොතේ තමන් ගැන ඇති වූ ලැජ්ජාවෙන් මෘදු වූ ඔහු ඇයට සුදු ලිනන් රෙද්දෙන් කළ ඇඳුම් දෙකක් ගෙනැත් දෙන්නැයි කීය. මේ ඇඳුම් ඔහු ඇයට තෑගිදෙන්නට සිතාගෙන ගෙනා ඒවා නොවී ය. ඒවා ඔහු ඇගෙන් ම හෝ ඇගේ ගෝත්‍රයේ ම වෙනත් දැරියකගෙන් හෝ සොරාගත් ඒවා ය.
>
> ජවුනිය්යාහ් පැමිණියේ කිරිමවක් සමග ය. ඇය තවමත් නොවැඩුණු දැරියක් ව සිටි බව මෙයින් පෙනේ. තමන් මරන්නට පවා අණ කළ හැකි ව තිබුණු මිනිසකුට ඇය එහෙම නිකම් මිනිහෙකුට කුමරියක් ඇය ව දෙනවද වැනි ගරුසරු නැති එඩිතර ප්‍රතිචාරයක් දක්වන්නට ඇත්තේ ද ළමාවියේ සිටි ඇයට එහි ප්‍රතිවිපාක ගැන වැටහීමක් නොවූ නිසා ය.
>
> මෙම හදීසයේ ඉංග්‍රීසි පරිවර්තකයා give me yourself යන්න ළගට *(in marriage)* යනුවෙන් වරහන් තුළ යොදා එක්කර තිබේ. මේ අදහස දෙන වචන මුල් හදීසයේ පෙළ තුළ දක්නට නැත. අරාබි පෙළේ ඇත්තේ හබ්බා නෆ්සිකා ලි යනුවෙනි. හබ්බා යන වචනය විවාහය හැඳින්වීමට භාවිත වූවක් නොවේ.
>
> හදීසයේ ඇත්තේ මුහම්මද් ඇයට පහර දෙන්නට සිය අත එසවූයේ ඇය එයින් මෙල්ල වනු පිණිස බව ය. මුහම්මද්ගේ ක්‍රියාවේ ඇති පහත් ගතිය දකින පරිවර්තකයා පහරදීම සඳහා යෙදී ඇති අරාබි වචනය strike යනුවෙන් පරිවර්තනය නොකර pat යනුවෙන් පරිවර්තනය කරයි. යෙදී ඇති අරාබි වචනය අහ්වා යන්නයි. එය පැමිණෙන්නේ හවා යන්නෙනි. එහි අදහස ක්ෂණිකව පහත හෙළීම, වේගයෙන් එල්ල කිරීම මිස තට්ටු කිරීම (patting) නොවේ.

> මුහම්මද් තැන් කළේ ඇයට සුරතල් ලෙස තට්ටු කරන්නට නම් ඇය *මම ඔබෙන් අල්ලාහ්ගේ රැකවරණය අපේක්ෂා කරනවා* යැයි කෑගැසුවේ ඇයි ? [6]

එතුමන් මේ සම්බන්ධව ක්‍රියා කර ඇත්තේ කෙසේදැයි දැනගැනීම අපට වැදගත් වන්නේ මුස්ලිම්වරුන් එතුමන් ව මිනිසුන් අතර පරිපූර්ණත්‍ව ම පුද්ගලයා ලෙස සලකන බැවිනි. ඔහු ව සිය ජීවිත ආදර්ශය ලෙස ගන්නා බැවිනි. ඔහුගේ ක්‍රියාවන් මුස්ලිම්වරුන් තමන්ට සපයා ඇති ආදර්ශයන් ලෙස සලකන බැවිනි.

4: 24 වැකියේ යුද්ධයෙන් අල්ලාගත් කාන්තාවන් සම්බන්ධයෙන් අධෝසටහනක් සපයන මවුදූදි එම වැකියේ සහ අබුදාවුද් 2150 හි සඳහන් වන අයුරින් අත්අඩංගුවේ පසුවන විට විවාහක කාන්තාවන් වුව ද තහනම් නොවීමට හේතුවන නීතිමය තත්වය මෙලෙස පහදයි.

> යුධසිරකාරියන් බවට පත් වූ කාන්තාවන් ඔවුන්ගේ අන්‍යාගමික ස්වාමිපුරුෂයන් යුධ කලාපයෙන් එපිට සිටීමේ හේතුව මත තහනම් නොවේ. මන්ද යත් යුධ කලාපයේ සිට ඉස්ලාම් නීතියේ ආධිපත්‍යය තිබෙන භූමියකට පැමිණීම හේතුවෙන් ඔවුන්ගේ විවාහ (ඉස්ලාම් නීතිය තුළ) බලරහිත වන බැවිනි. මෙවැනි කාන්තාවක් (ඇවැසි නම්) විවාහ කරගැනීමට හැකි අතර ඔවුන්ගේ හිමිකාරීත්වය දරන අයට ඔවුන් සමග ලිංගික සබඳතා පැවැත්වීමට ද හැකි ය. කෙසේනමුත් කාන්තාවක් සමග ඇයගේ ස්වාමිපුරුෂයාත් මුස්ලිම්වරුන්ගේ අත්අඩංගුවට පත්වී ඇති විටක එවැනි කාන්තාවක් සමග ලිංගිකව හැසිරීමට හැකි ද යන්න සම්බන්ධයෙන් විද්වතුන් අතර මතභේදයන් පවතී. ඉමාම් අබු හනීෆා ඇතුලු හනෆිවරුන්ගේ මතය වන්නේ එවැනි යුවලකගේ විවාහ බන්ධනය නො බිඳී පවතින බවයි. නමුත් ඉමාම් මාලික් සහ ඉමාම් ෂාෆි ඉ යන විද්වතුන්ගේ මතය වන්නේ එවැනි අවස්ථාවක දී ද විවාහ බන්ධනය බලරහිත වන බව යි. [7]

අබුදාවුද් 2150 අනුව සලකන විට නිවැරදි බව පෙනෙන්නේ ෂාෆි ඉ සහ මාලික් මද්හබ්වල අදහසයි.

තවදුරටත් මේ ගැන අදහස් දක්වන ඔහු යුධසිරකාරියන් වසයෙන් අල්ලාගන්නා වහල් කාන්තාවන් සම්බන්ධයෙන් පවතින විවිධ මිත්‍යාවන් තුරන් කළ යුතු බැවින් යැයි කියමින් ඉස්ලාම් නීතියේ මෙම කාන්තාවන් සම්බන්ධයෙන් පවතින නීතිමය තත්ත්වය තවදුරටත් පහදා දෙයි. එහි ඔහු කරුණු 10 ක් සඳහන් කරයි.[8] ඒ අනුව,

> 1) මුස්ලිම් සෙබලකුට තමාගේ සිරභාරයට පත් වූ සැණින් කාන්තාවක් සමග ලිංගික ව එක්වීමට අයිතියක් නැති අතර ඔවුන් (ඉස්ලාමීය) රජයට භාර දිය යුතු ය. එම කාන්තාවන් නිදහස් කරන්නේ ද, නැතිනම් කප්පම් ලබාගන්නේ ද, නැතිනම් සතුරන් යටතේ සිටින මුස්ලිම් සිරකරුවන් වෙනුවෙන් හුවමාරු කරගන්නේ ද, නැතිනම් සොල්දාදුවන් අතර බෙදාහරින්නේ ද යන්න තීරණය කරන්නේ රජය යි. සොල්දාදුවකුට ලිංගික ව හැසිරිය හැක්කේ එසේ රජය විසින් විධිමත් ව පවරාදෙනු ලැබූ ස්ත්‍රිය සමග පමණි.
>
> 2) එසේම එම සෙබලාට ඇය සමග ලිංගික ව එක්වීම් සිදුකළ හැක්කේ ඇගේ ඉද්දා ව සම්පූර්ණ වූ පසු පමණි. එනම් ඇය ගර්භණී වී ඇතිදැයි සොයාබැලීමෙන් පසුවයි. ඒ සඳහා වූ මසක කාලයෙන් අනතුරු ව ගර්භණී වී නොමැති නම් එක්විය හැකි ය.
>
> 3) ලිංගිකව හැසිරීමේ දී ඇය මුස්ලිම් ද නැද්ද යන්න ගැටලුවක් නොවේ.
>
> 4) මෙවැනි ස්ත්‍රියක් ස්පර්ශ කිරීමට පවා අයිතිය ඇත්තේ ඇය ව පවරා දුන් සෙබලාට පමණක් වන අතර ඇගෙන් ඔහුට උපදින දරුවන් ඔහුගේ නීත්‍යානුකූල දරුවන් ලෙසින් සැලකේ. ඔවුන්ට විවාහය තුළ උපදින දරුවන්ට හා සමාන වූ අයිතිවාසිකම් ඇත. එසේ ම දරුවකුගේ උපත ලැබීමෙන් පසු ඇය ව වෙනත් වහලියක් මෙන් විකිණිය නොහැකි වන අතර හිමිකරුවාගේ මරණයත් සමග ම නිදහස් ස්ත්‍රියක් බවට පත්වේ.

---

6 https://archive.org/details/UnderstandingMuhammadAliSina/page/n1
7 https://www.englishtafsir.com/Quran/4/index.html#sdfootnote45anc
8 https://www.englishtafsir.com/Quran/4/index.html#sdfootnote45anc

5) තමන් යටතේ සිටින වහල් ස්ත්‍රියක් වෙනත් අයකුට විවාහ කරදුන් විට ඇය සමග ලිංගික ව එක්වීමේ අයිතිය අහිමි වුවත් අනෙකුත් අයිතීන් එලෙස ම පවතී.

6) සිටිය හැකි වහල් ස්ත්‍රීන් සම්බන්ධයෙන් භාර්යාවන් කෙරෙහි මෙන් සීමාවක් පනවා නැත්තේ යුද්ධ හේතුවෙන් හසුවන කාන්තාවන් කොපමණ දැයි පූර්වාපේක්ෂා කළ නොහැකි බැවිනි. ඒ මිස යුද්ධයේ දී ඉහළ කැපකිරීමක් කළ අයට සිය සල්ලාල අරමුණු වෙනුවෙන් යුධසිරකාරියන් හැකිතරම් පිරිසක් පවරවා ගත හැකි බවට ඉන් අදහස් නොවේ.

7) නෛතික ව වහලුන් සැලකෙන්නේ දේපලක් වසයෙනි. ඒ අනුව ස්ත්‍රීපුරුෂභාවය කුමක් වුවත් වහලකු සම්බන්ධයෙන් තමාට ඇති අයිතිය වෙනයම් දේපලක් සම්බන්ධයෙන් කරන්නාක් මෙන් ම පවරා දිය හැකි ය.

8) වහල් කාන්තාවකගේ අයිතිය කෙනකුට රජය විසින් විධිමත්ව පවරා දීම නිදහස් ස්ත්‍රියක් ව ඇගේ දෙමාපියන් හෝ වාලිවරයකු විසින් විවාහ කරදීමට සමාන නෛතික තත්ත්වයක් උද්ගත කරයි. විවාහ වූ බිරියත් සමග මිනිසකු වරදක් යැයි කියා ලිංගිකව එක් නොවී නොසිටී. එබැවින් සමාන නෛතික තත්ත්වයක් ඇති වහල් ස්ත්‍රිය සමග ද එසේ කිරීම වරදකැයි කියා ලිංගිකව එක්වීමෙන් වැළකී සිටීමට හේතුවක් නැත.

9) රජය විසින් සිරකාරියක් කෙනකුට බාරදුන් විට මොන ම හේතුවක් නිසාවත් ඇය ව යළි ඔහුගෙන් ලබාගැනීමට රජයට හිමිකමක් නැත. මවුපියන්ට හෝ වලීවරයකුට විවාහකරදුන් ස්ත්‍රියක් ව යළි ගෙන්වාගැනීමට නොහැකිවාක් මෙනි.

10) එසේම කිසියම් හමුදා ප්‍රධානියකු යුධසිරකාරියන් තාවකාලිකව සෙබලුන්ගේ ලිංගික වින්දනය වෙනුවෙන් බෙදාහරින්නේ නම් හෝ ලිංගික ව එක්වීමේ අවස්ථාවන් සලසා දෙන්නේ එවැනි ක්‍රියාවකුත් අනාචාරයත් අතර කිසිම වෙනසක් නැති අතර අනාචාරය ඉස්ලාමීය නීතියට අනුව බරපතල අපරාධයක් බව ද කිව යුතු ය.

මෙහි මවුදූදි මෙම කරුණු සඳහන් කරන්නේ මේ ගැන මිත්‍යාවන් දුරුකිරීමේ අදහසින් බව කියයි. ඒ අනුව වහල් ස්ත්‍රීන්ගේ කැමැත්ත තිබිය යුතු බව පවසන හෝ ඔවුන් දූෂණය කිරීම වළක්වන වෙනයම් හෝ නීතිමය ප්‍රතිපාදනයක් තිබිණි නම් ඔහු එය සඳහන් නොකර සිටීමට හේතුවක් නැත. නමුත් මෙහි කිසිම කරුණක එවැන්නක් සඳහන් නොවේ. මෙහි ඇතැම් කරුණු මෙය විධිමත්, කිසියම් නියාමනයකට යටත් වූවක් කිරීමට උත්සහ දරා තිබෙන බවත් ඉස්ලාමය මෙම කාන්තාවන් කෙරෙහි දයාවන්ත වීමට යම් උත්සහයක් දරා ඇති බවත් ඇත්තකි. නමුත් එය කිසිසේත් ම ප්‍රමාණවත් යැයි කිව හැකි නොවේ. මෙහි 1, 2, 4, 10 කරුණු කිසියම් නියාමනයක් සිදුරන බව පෙනෙයි. විශේෂයෙන් ම දරුවකු ලැබූ ස්ත්‍රියක් විකිණිය නොහැකි වීමත් හිමිකරුගේ මරණින් පසු නිදහස් වීමත් අගය කළ යුතු ප්‍රතිපාදන ය. ඇගෙන් උපදින දරුවන් ද විවාහක දරුවන් හා ම සමතත්ත්වයේ සැලකීම ඊටත් වඩා අගය කළ යුතු ය. නමුත් මේ කිසිවකින් මෙහි භයානක බව තුරන් නොවේ.

රජයට භාරදීමට පෙර එක්විය නොහැකි වුවත් භාරදීමෙන් පසු ව ඔවුන් සම්බන්ධයෙන් පියවර ගැනීමේ අයිතිය රජයට ඇත. ඇවැසි නම් ඔවුන් ව සෙබලුන් අතර බෙදාහැරීමටද හැකි ය. ඔවුන්ට නිදහස් වීමට ඇත්තේ ක්‍රම තුනකි. හිමියා විසින් නිදහස් කිරීමෙන්, දරුවකු ලබා ඇත්නම් හිමියාගේ මරණය හේතුවෙන් සහ වෙනත් අයකුට විවාහ කරදුනහොත් පමණි. වෙනත් අයකුට විවාහ වීමේ දී ඇයට පූර්ණ විමුක්තියක් නැතත් තරමක ලිංගික විමුක්තියක් ලැබිය හැකි ය. දරුවකු ලැබූ වහල් ස්ත්‍රියකට ද මිදීමට නම් හිමිකරුවා මියයන තුරු බලාසිටීමට සිදු වේ.

මෙහි 8 වැනි කරුණේ දී මවුදූදි වහල් ස්ත්‍රිය විවාහක ස්ත්‍රියකගේ නෛතික තත්ත්වයට සම කරමින් ඔවුන් සමග ලිංගික සබඳතා සාධාරණීකරනය කරයි. නමුත් ඔහු අමතක කරන කරුණක් ඇත. ඒ විවාහක ස්ත්‍රියක් ඒ තත්ත්වයට පත්වීමේ දී ඒ සඳහා ඇයගේ තැමැත්ත ද සලකා බැලෙන බවත් වහල් ස්ත්‍රියක් අත්අඩංගුවට පත්වූයේ හෝ බෙදාහැරියේ හෝ ඇගේ කැමැත්තකින් නොවන බවත් ය. 9 වැනි කරුණේ දී විවාහක තත්වයට ම සම කරමින් නැවත රජයට ඇය ව මොනම හේතුවක් මතවත් ලබාගැනීමට අයිතියක් නැති බව

පවසන ඔහු එහි දී ද මෙවැනි අතපසුවීමක් කරයි. ඒ වහල් ස්ත්‍රිය මෙන් නොව විවාහක ස්ත්‍රියට දික්කසාදය නමැති විකල්පය (ඉස්ලාමීය නීතිය තුළ කාන්තාවට මුහුණදීමට සිදුවන අසීරුතා මැද්දේ වුවත්) ලබා දී තිබෙන බවත් වහල් ස්ත්‍රියට එවැන්නක් නොමැති බවත් ය. මේවා හුදෙක් මෙම විචාරකයාගේ ආකල්පයන් පමණක් විය හැකි වුවත් නැවත ලබාගැනීමට නොහැකි වීම බරපතල තත්ත්වයක් වන අතර එය ඔහු සිය අදහසක් ලෙසින් නොව නීති තත්ත්වය ම ලෙසින් පවසන බවත් පෙනී යන්නකි.

දැන් අපි වහල් ස්ත්‍රියක් හිමිකරු වෙතින් දූෂණයට ලක්වුවොත් ඊට එරෙහි ව ඉස්ලාමීය නීතිය යටතේ ඇයට ගත හැකි පියවර මොනවාදැයි බලමු. ඉස්ලාමීය නීතිය තුළ ස්ත්‍රීදූෂණය සැලකෙන්නේ විවාහයට පරිබාහිර ලිංගික සබඳතාවන් යන වරදේ (සිනා) එක් ප්‍රභේදයක් වශයෙනි. සාම්ප්‍රදායික ව (විවාහ වූ හෝ නොවූ) මුස්ලිම් පුරුෂයකුට මුස්ලිම් නොවන වහල් ස්ත්‍රියක් සමග ඇගේ කැමැත්ත ඇති ව හෝ නැති ව විවාහයට පරිබාහිර ලිංගික සබඳතා පැවැත්විය හැකි අතර එවැනි ලිංගික එක්වීමක් සිනා වරදක් ලෙස නො සැලකෙන බව විකිපීඩියා විශ්වකෝෂය පවසයි. අලි කෙසියාගේ Marriage and Slavery in Early Islam කෘතිය සහ SUR-Int'l Journal on Human Rights සගරාවට ඉසෙඩ් මීර් හුසේන් ලියූ ලිපියක් සහ Arab Law Quarterly සගරාවට එම්. එස්. සුජිමොන් ලියූ ලිපියක් මූලාශ්‍ර ලෙස එහි සඳහන් කර තිබේ. (බලන්න – Islam and Violance විකිපීඩියා පිටුවේ 204, 205, 206 පාදසටහන්) සිනා වැරදි පිළිබඳ සිද්ධාන්තය නිදහස් මුස්ලිම්වරුන් පමණක් ඉලක්ක කරගන්නා නිසා මුස්ලිම් නොවන වහලියක් දූෂණය කිරීම සිනා වරදක් ලෙසින් නොසැලකෙන බවත් එය සැලකෙන්නේ අදාල කාන්තාවට කළ අපරාධයක් වශයෙන් නොව ඇගේ හිමිකරුවාට එරෙහිව කළ අපරාධයක් වශයෙන් බවත් එම විකිපීඩියා ලිපිය ම සඳහන් කරයි. එම පිටුව ඒ. ඉන්ජිනියර්ගේ The Rights of Women in Islam සහ කෙසියා අලිගේ පොත සහ ජුවාන් එඩුවාර්ඩෝ කැම්පෝගේ Encyclopedia of Islam මූලාශ්‍ර ලෙස දක්වයි. (212, 228, 229 පාදසටහන් බලන්න)

ඉස්ලාමය වහල් කාන්තාවන් දූෂණය වීමට ඉඩ දී ඇත් ද යනු බලාගැනීමට නිර්ණායකයන් අපි ඉහත දී දැක්වුවෙමු. එනම් එක්කෝ එයට ඔවුන්ගේ කැමැත්ත තිබිය යුතු බවට පැවසීමයි. නැතිනම් දූෂණය වුවහොත් ඇයට ගත හැකි පිළියමක් තිබීමයි. මේ දෙකින් එකක් හෝ නොමැති නම් ඉස්ලාමය වහල් කතුන් දූෂණයට ඉඩ දෙන බවට නිගමනය කිරීමට අපට සිදුවේ. ඉහත විමර්ශනයෙන් එවැනි අසාධාරණයක් සිදුවන විට ගත හැකි ප්‍රතිපාදනයක් ඇත් ද යන්න ඔබට ම බලාගත හැකි ය.

Open Letter to Bagdadi මැයෙන් ඉස්ලාමීය රාජ්‍යයේ හිටපු කලීෆා බග්දාදිතුමන් වෙත එතුමන්ගේ ක්‍රියාකලාපයන් විවේචනය කිරීමට ඉස්ලාමීය මූලාශ්‍ර ඇසුරින් ප්‍රබල ලෙස තර්ක දක්වමින් ලිපියක් යවන ලද්දේ ලොව පුරා ඉස්ලාමීය වියතුන් 127 ක් විසිනි. එහි ඔවුන් ලිංගික වහල් සේවය ඉස්ලාමීය ව වැරදි බව පෙන්වීමට දක්වන තර්ක මෙබඳු ය.

> වහල් සේවය අහෝසි කිරීම ඉස්ලාමයේ අරමුණුවලින් එකක් වූ බව නොපිළිගන්නා කිසිම වියතෙක් නැත. අල්ලාහ් මෙසේ පවසයි. අකබා යනු කිමෙක් දැයි ඔබ දන්නෙහි ද? එය එක වහලෙකු නිදහස් කිරීමයි. නැතහොත් ඥාතීන්ගෙන් වූ කුසගින්නෙන් පෙළෙන එක් අනාථයකුට හෝ නැතහොත් දරිද්‍රතාවයෙන් පොළව කාගෙන සිටින එක් දුප්පතකුට හෝ එක්දිනක ආහාර ලබා දීම වන්නේ ය. (අල් බලද්, 90: 12-14) ....එයට වන්දි වශයෙන් තවකකු ස්පර්ශ කිරීමට පෙර ඔවුන් එක් වහලකු නිදහස් කළ හැරිය යුතු ය. (අල් මුජාදිලා, 58:3) මුහම්මද් නබි (සල්) තුමන් තමන් සතුව සිටි සියලුම ගැහැනු, පිරිමි වහලුන් නිදහස් කර ආදර්ශයක් සපයා තිබේ. සියවසක් පුරා මුස්ලිම්වරු සහ සමස්ත ලෝකය ම වහල් සේවය තහනම් කිරීමට සහ අපරාධයක් බවට පත්කිරීමට එකාවන් ව කටයුතු කර ඇත්තාහ. වහල් සේවයට තිත තැබීම වූ කලී මානව ශිෂ්ටාචාරය අත්කරගත් සුවිශාල ජයගුහණයකි. නබි (සල්) තුමන් ජහීලි යුගයේ පැවති පූර්ව ඉස්ලාමීය "සදාචාර සංස්ථාව" (හිලාෆ් අල්-ෆුදුල්) ගැන මෙසේ පැවසී ය. “එය ඉස්ලාමය තුළ ද තිබිය යුතු බව නියම කළේ නම් එය ද රැකගැනීමට මම බැඳී සිටියෙමි.” වහල් සේවය අහෝසි විය යුතු බවට මුස්ලිම්වරුන්ගේ සම්මුතියෙන් සියවසකට පසු ඔබ එය බිඳ දමා තිබේ. ඔබ කාන්තාවන් ගණිකාවන් ලෙස ගෙන සිටිමින් එමගින් භූමිය පුරා කලහය සහ විරෝධය (ෆිට්නා) ත් මිහිමත දූෂණය සහ අශ්ලීලත්වයත් පතුරා තිබේ. යටපත් කරන්නට ෂරියාව විසින් වෙහෙස නොබලා කටයුතු කළ සහ සම්මුතිය තුළින් සියවසකට වැඩි කාලයක් තහනම් කර

> තිබුණු දෙයක් ඔබ නැවත ක්‍රියාවට යොදවා ඇත. ලෝකයේ සෑම මුස්ලිම් රටක් ම වහල් සේවයට එරෙහි ප්‍රඥප්තිවලට අත්සන් තබා ඇත. ...පොරොන්දු ඔබ පරිපූරණ වශයෙන් ඉටු කරනු. මන්ද යත් පොරොන්දුව ගැන පරලොව දී ඔබවෙතින් නියත වශයෙන් ම ප්‍රශ්න කරනු ලැබේ. (අල් ඉස්රා, 17:34) මේ දැවැන්ත අපරාධය සහ ඒ හේතුවෙන් මුස්ලිම්වරුන්ට විදින්නට සිදුවන සෑම අවමානයක් ම සම්බන්ධයෙන් ඔබ වගකිව යුතු ය.

වහල් සේවය තහනම් කිරීම ඉස්ලාමයේ අරමුණ වූ බවට සාධක ලෙස මෙහි දක්වන්නේ ඇතැම් වැරදිවලට වන්දි වශයෙන් වහලුන් නිදහස් කිරීමට කර ඇති නියම කිරීම් ය. නැතහොත් පුන්‍ය ක්‍රියාවක් ලෙස වහලුන් නිදහස් කිරීමට කර ඇති නියමයන් ය. වැරදිවලට වන්දි වශයෙන් වහලුන් නිදහස් කිරීමට අණ කිරීමේ අරමුණ දඬුවමක් දීම මිස වහල් සේවය අහෝසි කිරීම නොවේ. පුන්‍ය ක්‍රියාවක් ලෙස වහලුන් නිදහස් කිරීමට අණ කිරීම තරමක් එවැන්නකට ළග නමුත් වහලුන් නිදහස් කළ යුතු ම බවක් ඉන් අදහස් නොවේ. හැරත් ඉන්නා වහලුන් නිදහස් කරන්නැයි කීමෙන් අලුතින් වහලුන් අල්ලා ගත නොහැකි බවක් ද අදහස් නොවේ. පුන්‍ය ක්‍රියාව ලෙස වහලකු නිදහස් කිරීම වෙනුවට දරිද්‍රතාවයෙන් පෙළෙන අයකුට ආහාර වේලක් දීම තෝරා ගැනීමට ද ඉඩ සලසා ඇත්තේ ය. වහලු සේවය තහනම් කිරීම අල්ලාහ් තයාලාගේ අභිප්‍රාය විණි නම් ඔහු ඌරුමස් හෝ පිළිම වන්දනය තහනම් කළාක් මෙන් එය ද ප්‍රකාශිත ව ම තහනම් කරනු ඇත. මෙහි දී ඇතමුන් පවසන්නේ එය එකල සමාජ සම්මත ව පැවති දෙයක් වූ නිසා එක්වර අහෝසි නොකර ක්‍රමික ව අහෝසි කිරීමේ මාවත තෝරා ගත් බවයි. පිළිම වන්දනය ද එකල දැඩි ව සම්මත වූ දෙයක් විය. එසේනම් කිසිවකුට හානියක් නොවන පිළිම වන්දනය එකහෙලා තහනම් කිරීමට තිබූ හයිය අමානුෂික දෙයක් වූ වහල් සේවය අහෝසි කිරීමට නොතිබුණේ මන්ද?

කුරානය මෙන් ම හදීසයන් ද වහල් සේවයට (ලිංගික වහල් සේවය ද ඇතුලුව) ඉඩ සලසා තිබේ. සාධක අපි ඉහත දැක්වුවෙමු. කුරානයත් අවසර දී ඇති දෙයක් මේ විද්වතුන් පවසන පරිදි මනුෂ්‍යා විසින් නිර්මිත නීතිවලින් (ප්‍රඥප්ති ආදියෙන්) තහනම් කළ නොහැකි ය. මනුෂ්‍යාගේ බුද්ධිය දෙවියන්ගේ ප්‍රඥාව තේරුම් ගන්නට අසමත් බැවිනි. (එය මගේ විශ්වාසය නොවුණත් ආබ්‍රහිමික ආගම්වල චින්තනය එයයි.) සමහරු පවසන්නේ අද වහලුන් නැති නිසා වහල් සේවය අභාවයට ගොස් ඇති බවත් කිසිවකු අල්ලාගෙන විත් වහලකු කරගන්නට ඉස්ලාමය ඉඩ දී නැති බවත් ය. මෙය නම් සැබෑවකි. නමුත් යුද්ධයක් සිදුවුවහොත් එහි දී අත්කරගන්නා සිරකරුවන් වහලුන් කර ගත හැකි ය. ඔවුන් ගැනෙන්නේ ද ගනීමත් හෙවත් යුද්ධයෙන් හමු වූ වස්තූන් ගණයට ම ය. අයතුල්ලා කුමේනිතුමන් ද වරක් පවසා සිටියේ *අද දවසේ දී අප කිසියම් රටක් සමග යුද්ධයක් සිදුවුවහොත් ඔවුන්ගෙන් අල්ලාගන්නා අය අපට වහලුන් වන* බව යි. කුරානය පහළ කර ඇත්තේ සෑමදාට ම වලංගු වන පරිද්දෙනි. ඒ අනුව මේ නියමයන් ද (වහල් කාන්තාවක් විවාහක වුවත් ඇය සමග එක්වීමට මුස්ලිම් සෙබලුන්ට බාධාවක් නැති බව කියවෙන 4:24 වැකිය ද ඇතුලු ව) සඳහට ම වලංගු ය. ඉහත අප දැක්වූ ඉස්ලාම් වියතුන් රැසක් බග්දාදිතුමන්ට යැවූ ලියැවිල්ලේ වහල් සේවය විරුද්ධ ව ඔවුන් දක්වන තර්ක අතර ලිංගික වහලියන්ගේ කැමැත්තක් නිර්දේශ කර ඇති බවට කුරාන හෝ හදීස ඇසුරින් සාධකයක් දක්වන්නේ දැයි ඔබට ම විමසිය හැකි ය. මේ ලිපිය යැවූයේ ලොව පුරා ඉස්ලාම් වියතුන් 127 කි. යැවූයේ ඉස්ලාම් ධර්මය පිළිබඳ ආචාර්ය උපාධියක් සහිත නැවත පුනරාගමනය වූ ඉස්ලාමීය රාජ්‍යයේ (අවසන් විනිශ්චයට පෙර යළි ඉස්ලාමීය රාජ්‍යය බිහිවන බවත් මුස්ලිම්වරුන් යුදෙව්වන් ඝාතනය කරන තුරු අවසන් විනිශ්චය සිදු නොවන බවත් නබිතුමන් පවසා තිබේ. එවිට යුදෙව්වන් ගස් ගල් පිටුපස සැගවෙනු ඇති බවත් ගස් ගල් පවා මා පිටුපසත් යුදෙව්වෙක් සිටී, මුස්ලිම්වරය පැමිණ ඔහුගේ හිස ගසාදමන්නැයි පවසන බවත් නබිතුමන් පවසා තිබේ.[9] ඇඩොල්ෆ් හිට්ලර් මේ වචන පැවසීම ගැන එතුමන්ට ප්‍රශංසා කළේ ය.[10 11]) පළමු

9 https://sunnah.com/muslim/54/105

10 https://en.wikipedia.org/wiki/Relations_between_Nazi_Germany_and_the_Arab_world

11 Mounting evidence that hitler was a muslim and practiced islam - conservativepapers.com

කාලිෆ්වරයා ව පත් වූ බග්දාදිතුමන්ට ය. මේ වියතුන්ගේ ඉස්ලාමීය දැනුම ඉතා ඉහළ මට්ටමක නැති නම් ඔවුන් එවැනි කාර්යයකට අතගසන්නේ නැත. ඔවුන් කෙතරම් ශාස්ත්‍රීය ව තර්ක දක්වා ඇත් දැයි එය කියවා විමසිය හැකි ය. අනෙක් අතට ඔවුන්ගේ එකම අරමුණ මේ ක්‍රියාකලාපයන් වැරදි බව හිටපු කාලිෆ්තුමන්ට පෙන්වා දීම විය. නමුත් ඔවුන් ලිංගික වහල් සේවය පිළිකුල් කරනවා විනා ලිංගික ව එක්වීමට ඔවුන්ගේ කැමැත්තක් තිබිය යුතු බවට ඉස්ලාමීය තර්කයක්  දක්වන්නේ ද? එවැන්නක් තිබුණි නම් සතුටින් එය ගෙනහැර දක්වන බව නිසැක ය.

සවුදියේ ප්‍රමුඛ පෙළේ ඉස්ලාමීය නීතිවේදියෙක් වන ෂෙයික් සාලේ අල් ෆව්සාන් වරක් දේශනයක දී  පවසා සිටියේ *වහල් සේවය ඉස්ලාමයේ අංගයක්, එය ජිහාඩයේත් අංගයක්, ඒ වගේම ඉස්ලාමය පවතින තුරු ජිහාඩයත් පවතිනවා* යනුවෙනි. මෙයට ප්‍රතිවිරුද්ධ මත දරන මුස්ලිම්වරුන් සත්‍ය නොතකා හරින නිවැරදි ඉස්ලාමය නොදන්නා අය යැයි ද ඔහු පවසා සිටියේ ය. මෙම නියෝගය (ෆත්වා) නිකුත් කරන විට අල් ෆවුසාන් සවුදියේ ඉහළ ම ආගමික මණ්ඩලය වන පූජකවරුන්ගේ ජ්‍යෙෂ්ඨ සංගමයේත්, ආගමික නියෝග සහ පර්යේෂණ කවුන්සලයේත් සමාජිකයෙක් වූවා පමණක් නොව රියාද් හි මිතායබ් කුමරු පල්ලියේ ඉමාම්වරයා මෙන් ම මොහමඩ් බින් සාවුද් ඉස්ලාමීය විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙක් ද විය. තවද අල් අෂර් සරසවියේ ඉස්ලාමය පිළිබඳ මහාචාර්යවරියක වන සුයාද් සාලේ ද රූපවාහිනී වැඩසටහනක දී පැවසුවේ නීත්‍යානුකූල ව අරඹන ජිහාඩයක දී අත්කරගන්නා යුධසිරකාරියන් දූෂණය කිරීම ඉස්ලාමය අනුව වරදක් නොවන බව ය.[12] [13] [14]ඇයගේ නිදසුනට අනුව ඔවුන් ඊශ්‍රායලය ආක්‍රමණය කළොත් යුදෙව් කතුන් මුස්ලිම් හමුදා ප්‍රධානියකුගේ අතට පත්වන්නේ ඔවුන් ව ලජ්ජාවට පත්කිරීම දෙවියන්ගේ අරමුණ වන බැවිනි!

මේ සියලු කරුණු අනුව අපට කිවහැක්කේ ඉස්ලැමික් ඉස්ටේට් සංවිධානය යසිදී කාන්තාවන් දූෂණය කිරීම (එසේ කිරීමෙන් වළකින අය ව කුරාන වැකිවලට සමච්චල් කරන අය බවත්, එසේ කිරීමෙන් ඔවුන් ඉස්ලාමය හැරගිය අය වන බවත් පවසා එම සංවිධානය එය කිරීම ප්‍රතික්ෂේප කරන සෙබලුන් පවා මරා දමති.) ඉස්ලාමයේ ප්‍රතිපාදන වැරදියට වටහා ගත්, විකෘති අර්ථනිරූපණ සැපයූ හෝ ඉස්ලාමයට විරුද්ධ දෙයක් හෝ නොවන බවයි. ඔවුන් යසිදි කාන්තාවන් දූෂණය කිරීම ඉස්ලාම් ධර්මය (ධර්මය?) ට අනුව සිදුකරන ක්‍රියාවකි. ගැහැනුන් දූෂණය කිරීම අනුමත කරන ආගමක් ඇදහීම ගැන මම ඔබට කිසිවක් නොකියමි. ඔබ කැමති දෙයක් විශ්වාස කිරීම ඔබේ අයිතියයි. නමුත් එවැනි දර්ශනයක් ආගමක් යැයි කිවහැක්කේ කෙසේද? ආගම යනු මිනිසුන් සදාචාරසම්පන්න, ශිෂ්ටසම්පන්න බවට පත්කිරීම අරමුණු කරගත් ඉගැන්වීමකි. ඉස්ලාමය එවැනි ඉගැන්වීමක් යැයි කීමට නම් යුධසිරකාරියන් දූෂණය කිරීම සදාචාරසම්පන්න, ශිෂ්ටසම්පන්න ක්‍රියාවක් විය යුතු ය. ස්ත්‍රීදූෂණය යහපත් දෙයක් යැයි ඔබ සිතන්නේ නම් හෝ වහල් කාන්තාවන් දූෂණය වීම වැළැක්වීමට අනුබල දෙන, මා අතින් මගහැරුණු ඉස්ලාමීය මූලාශ්‍රයක් සොයාගත හැකි නම් ඔබට ස්ත්‍රීදූෂණයට අනුබල දෙන්නකු වීමේ ලැජ්ජාවකින් තොර ව ඔබේ ආගම ඇදහිය හැකි ය.

- සචින්ත මදූෂාන්

---

12 https://youtu.be/Hj-Bx4SYufA

13 https://www.express.co.uk/news/world/635942/Islam-Scholar-Saud-Saleh-Cairo-Slavery-Muslim-Women-Pagan-ISIS-Al-Azhar-University-Egypt

14 https://www.cairoscene.com/BusinessAndPolitics/Muslim-Scholar-Says-It-s-OK-to-Rape-Non-Muslim-Women-to-Humiliate-Them